නුවනත විද්‍යුත් සිංහල සඟරාව
වෙළුම 01, 2022, 64 - 72



සිංහල අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය

# බණකතා සාහිත්‍යයේ ජීවිත පරිඥානය

## 1.0 ප්‍රවේශය

සිංහල සාහිත්‍යය මූලික වශයෙන් ම බුදුදහම ඇසුරේ වැඩුණු සාහිත්‍යයක් බව පැහැදිලි ව පෙනෙයි. එහෙයින් සම්භාව්‍ය සාහිත්‍යය පිළිබඳ දෘෂ්ටි දෙකක් හෙළිය හැකි ය. එකක් නම් ඒවා බුදුදහමේ පරමාර්ථ ඉදිරිපත් කිරීමේ කෘති වශයෙන් සලකා බැලීම යි. එහි දී විශේෂයෙන් බුදුදහමේ ඉගැන්වීම් ආශ්‍රයයෙන් ජීවිතාවබෝධයත් යහපත් සමාජයක් උදෙසා ධර්මෝපදේශයත් ලබා දීම සලකා බැලිය හැකි ය. දෙවැන්න නම් ඒවා සාහිත්‍ය කෘති වශයෙන් සලකා බැලීම යි. සාහිත්‍ය කෘති වශයෙන් බලන කල ඒවායෙහි ඇති සාහිත්‍යාත්මකභාවය සහ ජීවිතය විවරණය කිරීම සලකා බැලිය හැකි ය. මෙහි දී අපගේ උත්සාහය වන්නේ සිංහල සාහිත්‍යයේ බණකතා ගණයෙහි ලා ගැනෙන කෘති කිහිපයක් පමණක් උපයෝගී කරගෙන ඒවායෙහි ඇති ජීවිත පරිඥානය කවරේ ද යන්න විමසීම යි. එහෙයින් මෙහි දී පළමුවෙන් ම සිංහල සාහිත්‍යයේ බණකතා නම් සාහිත්‍යාංගය පිළිබඳ මූලික විවරණයක් කෙරෙන අතර, ඉන් අනතුරු ව බණකතා කෘති කිහිපයකින් තෝරා ගත් කතා සහ අවස්ථා ඇසුරෙන් ඒවායෙහි ඇති ජීවිත පරිඥානය විවරණය කෙරේ.

## 1.1 බණකතා සාහිත්‍යය

### 1.1.1 සාහිත්‍යය හැඳින්වීම

'සාහිත්‍යය' යන වචනය සැකසී ඇත්තේ ‘සහිත’ යන්නට ‘යණ්’ යන භාවාර්ථ තද්ධිත ප්‍රත්‍යය එකතු වීමෙනි (විපුල හිමි, 2013, පි. 323). ඒ අනුව ‘සාහිත්‍යය’ යන්නෙහි අර්ථය වන්නේ ‘සහිත භාවයෙන් යුක්ත වූ දෙය’ (සහිතස්‍ය භාවඃ සාහිත්‍යම්) යන්න යි. (විපුල හිමි, 2013, පි. 323). මෙහි දී අප වටහා ගත යුතු වැදගත් ම වචනය වන්නේ ‘සහිත’ යන්න යි. ‘සහිත’ යන්නෙහි ‘එක් වූ / සංගත වූ’ යන අර්ථය ඇත. (සන්නස්ගල, 1992, පි. 587). ඒ අනුව ‘සාහිත්‍යය’ යන වචනයේ අර්ථය වන්නේ ‘සංගත භාවයෙන් යුක්ත වූ දෙය’ හෙවත් ‘එක් වූ බවින් යුක්ත වූ දෙය’ යන්න යි. එක් වී ඇත්තේ කවර දෙයක් ද යන්න විචාරකයන්ට විවිධ ආකාරයෙන් අර්ථ ගැන්විය හැකි ය. සංස්කෘත විචාරකයන් ‘‘ශබ්දාර්ථයෝර් යථාවත් සහ භාවේන විද්‍යා සාහිත්‍ය විද්‍යා’’ යනුවෙන් අර්ථ දක්වන පරිදි ‘සාහිත්‍යය’ යන්නෙහි ඇති ‘එක් වීම’ නම් ‘ශබ්ද සහ අර්ථ’ වශයෙන් ගැළපීම යි. (විපුල හිමි, 2013, පි. 323). ඒ අනුව භාෂාවේ ඇති ශබ්දාර්ථ ඉතා මැනවින් එක්වීම යන අර්ථය වචනාර්ථ වශයෙන් ‘සාහිත්‍යය’ යන්නෙන් ලැබේ. ශ්‍රී සුමංගල ශබ්දකෝෂය ‘සාහිත්‍යය’ යන්න ‘අර්ථවත් වාක්‍යය’ යනුවෙන් ද අර්ථ දක්වා තිබේ. (සෝරත හිමි, 1999, පි. 1073). එස්රා පවුන්ඩ් දක්වන ‘‘ශ්‍රේෂ්ඨ සාහිත්‍යය යනු උපරිම තලයට අර්ථ කැවුණු භාෂාව වේ’’ යන නිර්වචනයෙන් ද සාහිත්‍යයේ දී භාෂාව ඉතා මැනවින් අර්ථ ගන්වා භාවිත කිරීම ඉස්මතු කර තිබේ. (pound, 1934, p. 28).

‘සාහිත්‍යය’ යන්න භාවිත වී ඇති අර්ථ සැලකූ කල එහි එක් වීම, කාව්‍යානුශාසනා, කාව්‍යය’ යන අර්ථ තුන ඇත (පඤ්ඤාකිත්ති හිමි, 2000, පි. 4). මුල් කාලයේ ‘සාහිත්‍යය’ යන්න ‘ප්‍රයෝජනවත් සියලු

9 772950 655005

පොතපත' සඳහා යෙදී ඇත. එහි නිර්මාණාත්මක භාවය තිබීම අත්‍යාවශ්‍යයෙන් නො සැලකිණි (ඤාණසීහ ස්ථවිර, 1964, පි. 5 - 6). සිංහල ශබ්දකෝෂය 'සාහිත්‍යය' යන්න 'යම් භාෂාවකට අයත් ලිවීම් සම්භාරය, යම් බසකට විෂයයකට අයත් පොතපත, නිබන්ධන සමූහය' යනුවෙන් අර්ථ දක්වා තිබෙන්නේ (සන්නස්ගල, 1992, පි. 689). එහෙයිනි. එහෙත් නූතනය වන විට ලිඛිත ඕනෑ ම දෙයක් 'සාහිත්‍යය' යනුවෙන් සැලකෙන්නේ නැත. එහි ඉහත 'සාහිත්‍යය' යන්නෙහි කෝෂාර්ථ වශයෙන් දැක් වූ 'කාව්‍යානුශාසනා, කාව්‍යය' යන අන්තර්ගතය තිබිය යුතු ය. ඒ අනුව නිර්මාණාත්මකභාවය සහ චමත්කාරය ඇති ලිඛිත හෝ අලිඛිත ප්‍රබන්ධ සමූහය සාහිත්‍යය නම් වේ. නිර්මාණාත්මකභාවය සහ චමත්කාරය ඇති කෙරෙන්නේ භාෂාව මාර්ගයෙනි. ඒ අනුව 'සාහිත්‍යය යනු භාෂාව මාර්ගයෙන් නිර්මාණාත්මකභාවය සහ චමත්කාරය ඇති කෙරෙන ප්‍රබන්ධ විශේෂය වේ' යනුවෙන් අර්ථ ගැන්විය හැකි ය. නූතනය වන විට 'සාහිත්‍යය' යන්න අර්ථ කථනය කිරීමේ දී එහි ප්‍රයෝජන ද අන්තර්ගතය ද යොදා ගනු පෙනේ.

### 1.1.2 සාහිත්‍යාංගයක් වශයෙන් බණකතා සාහිත්‍යය

සාහිත්‍යය සහෘදයා වෙත ප්‍රවේශ කෙරෙන ආකාරය අනුව ශ්‍රව්‍ය - දෘශ්‍ය ලෙස වර්ග කළ හැකි ය. ශ්‍රව්‍ය කාව්‍ය නැවත ගද්‍ය සහ පද්‍ය යනුවෙන් කොටස් කළ හැකි ය. දෘශ්‍ය යනුවෙන් හැඳින්වෙන්නේ නාට්‍යය යි. භාෂාව භාවිත කෙරෙන ආකෘතිය අනුව ද සාහිත්‍යය ගද්‍ය - පද්‍ය - මිශ්‍ර යනුවෙන් වර්ග කළ හැකි ය. නාට්‍ය, ගද්‍ය කොටස්වලින් මෙන් ම පද්‍ය කොටස්වලින් ද යුතු වන හෙයින් මිශ්‍ර යන වර්ගයට අයත් ය. මේ අනුව සාහිත්‍යයේ ගද්‍ය - පද්‍ය - නාට්‍ය යනුවෙන් ප්‍රධාන ප්‍රභේදත්‍රයයක් ඇති බව පැහැදිලි වේ. මේ එක් එක් ප්‍රභේදය අනුලක්ෂණ අනුව තවත් ප්‍රභේද කළ හැකි ය. මෙහි දී අපට වැදගත් වන්නේ 'ගද්‍ය' නමැති සාහිත්‍යාංගය යි. එහෙයින් එහි ස්වභාවය අවබෝධ කර ගැනීම අවශ්‍ය ය.

ගද්‍ය යන්න ශ්‍රීමත් දණ්ඩි ආචාර්යයන් විග්‍රහ කරනුයේ 'ආපාදඃ පද සන්තානෝ ගද්‍යම්' යනුවෙනි. එයින් පැවසෙන පරිදි ගද්‍යය යනු පාද රහිත වචන සමූහයකි. සාහිත්‍ය දර්පණයෙහි කර්තෘ විශ්වනාථ පඬිවරයා කියන පරිදි ගද්‍යය යනු වෘත්තක සුවඳින් මිදුණ පද සමූහය යි. ඒ බව හෙතෙම 'වෘත්තගන්ධෝජ්ඣිතං ගද්‍යං' යනුවෙන් සාහිත්‍ය දර්පණයෙහි දක්වයි. ගද්‍ය සඳහා දක්වා ඇති සංස්කෘත ආලංකාරිකයන්ගේ විග්‍රහවලට අනුව ගද්‍යයේ ලක්ෂණ දෙකකි. එනම් පාදවලට බෙදා නොපැවතීම හා වෘත්තකින් නොබැඳී පැවතීම යි. මෙම ලක්ෂණ දෙක ගද්‍යයේ ලක්ෂණ දෙක වේ. (විපුල හිමි, 2017, පි. 9 - 10).

මෙසේ වූ ගද්‍යය, ගද්‍ය කාව්‍යයක් වන්නට නම් සාහිත්‍යික ලක්ෂණ එයට අන්තර්ගත විය යුතු ය. එසේ වන ගද්‍ය කාව්‍යය එහි අන්තර්ගතය සහ රීතිය අනුව විවිධ ආකාරයට බෙදිය හැකි ය. සිංහල සාහිත්‍යයේ ගද්‍යය සම්භාව්‍ය/ චිරන්තන/ පුරාතන ගද්‍ය හා නූතන ගද්‍ය යනුවෙන් එක් ආකාරයකින් වර්ග කළ හැකි ය. තවත් ආකාරයකින් ඉතිහාස කථා, කල්පිත කථා, චරිත කථා, බණකතා, ජනකථා ආදි වශයෙන් බෙදිය හැකි ය. තවත් ආකාරයකින් අර්ථ ව්‍යාඛ්‍යාන, ධර්ම ව්‍යාඛ්‍යාන ආදි වශයෙන් බෙදිය හැකි ය. මෙහි දී අපගේ සාකච්ඡාවට ලක් වන්නේ බණකතා නම් ගද්‍ය විශේෂය යි. එහෙයින් එය හඳුනා ගැනීම වැදගත් ය.

9 772950 655005

සිංහල ශබ්දකෝෂය ‘බණකතා’ යන්න අර්ථ දක්වන්නේ ‘‘බුදු දහම සඳහන් වූ කතාව; බුද්ධ ධර්මය ගැබ් වුණු හෝ ඊට සම්බන්ධ කථාව’’ යනුවෙනි (සන්නස්ගල, 1992, පි. 36). එවිට ‘බණකතා සාහිත්‍යය’ යනුවෙන් අදහස් වන්නේ ‘බුදු දහම ගැබ් වූ හෝ ඊට සම්බන්ධ කථා අන්තර්ගත වන සාහිත්‍යය යි. බණකතා ධර්ම ව්‍යාඛ්‍යාන යන නමින් ද හැඳින්විය හැකි හෙයින් (ප්‍රාචීන භාෂෝපකාර සමාගම, 2000, පි. 32). බණකතා සාහිත්‍යය ධර්ම ව්‍යාඛ්‍යාන සාහිත්‍යය යනුවෙන් ද හැඳින්විය හැකි ය. මේ කෘතිවල එක ම ස්වභාවය බණකතා අන්තර්ගත වීම ම නො වේ. සියුම් ව බලතොත් ඊට එහා ගිය ලක්ෂණ සමූහයක් මේවායෙහි සොයා ගත හැකි ය. මාර්ටින් වික්‍රමසිංහ බණකථා සාහිත්‍යය නම් කෘතියේ දී ‘ජනකථා අනුව ලියවුණු නවකථා’ යන මාතෘකාව යටතේ කරන විවරණයේ දී මේ පිළිබඳ කරන නිරීක්ෂණය මෙහි දී වැදගත් ය.

> ‘ගමකථාව’ හා ‘බණකථාව’ නමින් හැඳින්වෙන කථා විශේෂ දෙකක් පෙර සිංහලයෙහි වී ය. නම් දෙකකින් ඒ කථා හඳුන්වන ලද්දේ ගමකථාවෙහි නැති අපූරු අවයවයක් බණකථාවෙහි ද බණකථාවෙහි නැති අපූරු අවයවයක් ගමකථාවෙහි ද වූ නිසා නො වේ: කථා විෂය, අර්ථය හා භාෂාව ද විසින් ඒ කථා දෙවර්ගය වෙනස් වූ හෙයිනි (වික්‍රමසිංහ, 2008, පි. 7).

වික්‍රමසිංහගේ මේ ප්‍රකාශනයට අනුව බණකතාවල එයට අනන්‍ය වූ කථා විෂයයක්, අර්ථයක් හා භාෂාවක් ඇත. කතා කියූවන්ගේ අද්දැකීම්, අදහස්, පරමාර්ථ, උගත්කම් අනුව ගමකතාවෙන් වෙනස් වූ බණකතාව ඇතැම් විටක දී ගැමියන්ගේ කටවහරට යාමෙන් ඔවුන්ගේ අදහස් හා බස ද අනුව වෙනස් වීමෙන් ගමකතාව වී ඇති බව වික්‍රමසිංහ ඉස්මතු කරයි. බණකතාව ව්‍යක්ත ලේඛනයෙන් වෙනස් ව ගිය ආකාරය පිළිබඳ අවධානය දක්වන ඒ.වී. සුරවීර බණකතා විෂයයෙහි කරුණු දෙකක් ඉස්මතු කරයි.  ඉන් පළමු වැන්න නම් බණකතා යනු ව්‍යාකරණයට වහල් වූ හුදු ශාස්ත්‍රීය සංග්‍රහ නොවන බවත් ශ්‍රාවකයන් පහන් සංවේගයට පත් කරමින් ළගන්නා බණ කියූ කෘති බවත් ය. (සුරවීර, 2014, පි. 29). මේ සඳහා ඔහු සද්ධර්මරත්නාවලියේ ආරම්භයේ එන ‘ක්‍රමවිලංඝනාදි අඩු වැඩි ඇතත්’ යන ප්‍රකාශනය ද වහල් කර ගනී. ධර්මසේන හිමියන් ‘ක්‍රමවිලංඝනයක්’ පිළිබඳ විශේෂයෙන් සඳහන් කරන්නේ මේ බණකතා ව්‍යාකරණයට වහල් වූ ශාස්ත්‍රීය කථාවෙන් පිට පන්වා බණ කීමේ අරමුණට අනුව ඒවා ඉදිරිපත් කෙරෙන නිසා බව සුරවීර ඉස්මතු කරයි. සුරවීර ඉස්මතු කරන දෙවන කරුණ වන්නේ ‘‘මේ ලේඛකයෝ එතෙක් පණ්ඩිතප්‍රිය ව පැවති කව්ලැකිය නො ව ලෙව්ලැකිය ම ගරු කළෝ ය’’ (සුරවීර, 2014, පි. 29) යන්න යි. ඒ අනුව බණකතා සංග්‍රහ පසු කල ලෙව්ලැකියට බර ව ඉදිරිපත් කෙරුණු බව පෙනේ. මේ අනුව බණකතා සාහිත්‍යය යනු ක්‍රමානුකූල ව ගමකතාවට ආසන්න ව ද එහෙත් ඊට වෙනස් ව ද ඇතැම් කරුණු අතින් ශාස්ත්‍රීය කථාවෙන් ද වෙනස් ව බණ කීමේ අරමුණ අනුව සකස් වූ සාහිත්‍යයක් බව පෙනේ. ඒ අනුව බණකතා සාහිත්‍යයේ නියම ස්වභාවය දැකිය හැක්කේ එහි ආරම්භක අවධියේ නො ව, එය සකස් වුණු පසු කාලයේ දී ය.

බණකතා කෘති සිංහල සාහිත්‍යයේ ආරම්භක අවධියේ සිට පැවති බව උපකල්පනය කළ හැකි ය. ත්‍රිපිටකයට හෙළ බසින් ලියවුණු අට්ඨකථාවල බුදුදහම ගැබ් වුණු හා ඒ හා සම්බන්ධ වුණු කතා පවතින්නට ඇත. එමෙන් ම ලක්දිව උපන් කතා ඇසුරු කොට සකස් කෙරුණු බණකතා සංග්‍රහ ද මුල්

9 772950 655005

කාලයේ වූ බව පෙනෙයි (ගම්ලත්, 2004, පි. 12). විද්‍යමාන ග්‍රන්ථ අතුරෙන් බණකතා ගණයෙහි ලා සැලකිය හැකි ප්‍රථම කෘතිය වන්නේ ගුරුළුගෝමීන්ගේ අමාවතුර යි. ඉන්පසු ව බුත්සරණ, දම්සරණ, සඟසරණ, සද්ධර්මරත්නාවලිය, පන්සිය පනස් ජාතක පොත, ථූපවංසය, පූජාවලිය, සද්ධර්මාලංකාරය ආදි කෘති දක්නට ලැබේ. මේවායින් ඇතැම් කෘතියක් එක් කරුණක් ඉස්මතු කෙරෙන කතා සංග්‍රහ කිරීමෙන් සැකසුණු කෘතියකි. ඇතැම් කෘතියක් විවිධ වූ කරුණු ඉස්මතු කෙරෙන කතා සංග්‍රහ කිරීමෙන් සැකසුණු කෘතියකි. ඒ කෙසේ වෙතත් පොදුවේ මේ බණකතාවල අරමුණ වූයේ ''ආගමානුකූල ව ජීවත් වීමේ ආනිසංස හා ඊට ප්‍රතිවිරුද්ධ ව ජීවත් වීමේ විපාක ඵල විදහා දැක්වීම ය. ආගමානුකූල ව ජීවත් වීමට අවශ්‍ය ධර්මය හා පූජනීය වස්තුවල ඉතිහාසය තේරුම් කර දීම ද එයින් සිදු විය'' (ගම්ලත්, 2004, පි. 12).

## 1.2 බණකතා සාහිත්‍යයේ ජීවිත පරිඥානය

කරුණු දෙකකින් බණකතා සාහිත්‍යයේ ජීවිත පරිඥානය තිබිය යුතු ය. එකක් නම් ඒවා බණකතා හෙවත් බුදුදහම ගැබ් වුණු හෝ බුදුදහම හා සම්බන්ධ වුණු කතා වීම යි. දෙවැන්න නම් ඒවා සාහිත්‍ය ගණයෙහි ලා සැලකෙන කතා වීම යි. බණකතා සංග්‍රහ රචනා කෙරුණේ ම ශ්‍රාවකයාට ධර්මාවබෝධය ලබා දී ඔවුන් යහමඟෙහි යෙදවීමට ය. සද්ධර්මරත්නාවලිය ආරම්භයේ දී ම ධර්මසේන හිමි තමන්ගේ කෘතිය ''... නුවණ මඳවත් කුසලච්ඡන්දය ඇති ව ධර්මාභියෝගයට උපදෙස් ලදින් බණ දැන පිංකමැ හැසිර නිවන් සාධා ගනිත් නම් එසේ වූ සත්පුරුෂයන්ට වැඩ සඳහා....'' (ඤාණවිමල හිමි, 2017, පි. 01). රචනා කරන බව දක්වා ඇත. සද්ධර්මාලංකාරය ද රචනා කොට ඇත්තේ ''සාධුජනයන්ගේ සිත් පහදවා ශ්‍රද්ධා බුද්ධි වර්ධනය කෙරෙමින් ඔවුන්ට ත්‍රිවිධ සම්පත් සාධා දෙන පිණිස'' (ප්‍රාචීන භාෂෝපකාර සමාගම, 2000, පි. 30) ය. වෙනත් බණකතා කෘතිවල ද අරමුණ බලතොත් පැහැදිලි වන්නේ ඒ සියල්ලක් ම රචනා කොට ඇත්තේ මිනිසුන්ට බුදුදහම ඉගැන්වීමට ය. බුදුදහම ඉගැන්වීම යනු ජීවිතයේත් සංසාරයේත් ස්වභාවය පිළිබඳ බුදුන් වහන්සේගේ දේශනා ඉගැන්වීම ය. බණකතා ලියූ වියතුන් ඒවා ලියා ඇත්තේ බුදුදහමේ එන ඒ ඉගැන්වීම් ඉස්මතු වන පරිදි ය. ඒ හෙයින් ඒ කතාවල ජීවිත පරිඥානය තිබීම බලාපොරොත්තු විය යුත්තකි. සාහිත්‍යයට විෂය වන්නේ මිනිස් ජීවිතය යි. මිනිස් ජීවිතය විවරණය කිරීමක් එයින් කෙරේ. එහෙයින් අවශ්‍යයෙන් ම සාහිත්‍යය මගින් ජීවිත පරිඥානය ලබා දෙයි. බණකතා සාහිත්‍යයේ අන්තර්ගත වන ජීවිත පරිඥානය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී මාර්ටින් වික්‍රමසිංහගේ පහත සඳහන් ප්‍රකාශනය අපට වැදගත් වේ.

> 'හොඳ ම ජාතක කථා, එක බෞද්ධයකුගේ නො ව බෞද්ධ භික්ෂූන් හා ගිහියන් පරපුරකගේ සාංඝික අද්දැකීමත්, ප්‍රතිභාවත්, භාවනාවත්, සමාධියත් පිළිබිඹු කෙරෙන රචනා ලෙස මම සලකමි. උගතුන් පරපුරකගේ අද්දැකීම හා වැටහෙන නුවණ නැවතීමක් නැති ව වැඩුණු බැවින් වෘද්ධත්වයෙන් උසස් වෙයි.

එවැනි සාමූහික වෘද්ධ ඤාණයකින් ජාතකකථා සඳහා තෝරා ගන්නා ලද මානව චරිතාංග බටහිර උසස් නවකථාකාරයන් තමන්ගේ කථාවලට තෝරා ගත් මානව ජීවිතයටත්

9 772950 655005

ඒ ජාතක කථාවලින් ප්‍රකට වන මානව ධර්ම වාදය ඔවුන්ගේ මානව ධර්ම වාදයටත් සමාන වීම පුදුමයට හේතු නො විය යුතු ය (වික්‍රමසිංහ, 2008, පි. 9).

පරම්පරාවක අද්දැකීම හා වැටහෙන නුවණ අනුව ගොඩ නැඟී ඇති බණකතාවල අන්තර්ගත ජීවිත පරිඥානය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී විශේෂයෙන් සාකච්ඡා කළ යුතු කථා සමූහයක් පැවතියත් මෙහි දී කෘති තුනකින් කතා තුනක් පමණක් යොදා ගනු ලැබේ.

අසනස (අසනීසාත) කුමාරයා පිළිබඳ සඳහන් වන චුල්ලපලෝභන ජාතකය (ආනන්ද කුලසූරිය ඇතුළු පිරිස කළ සංස්කරණයේ 164 වන ජාතකය) ජීවිතය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දෙන්නකි. එහි එන කතාව සැකෙවින් මෙසේ ය. බෝසතාණෝ බඹ ලොවින් චුත ව අවුත් බ්‍රහ්මදත්ත රජුගේ අගමෙහෙසියගේ කුස පිළිසිඳ ගෙන උපදිති. උපන් දා පටන් බෝධිසත්ත්වයෝ කාන්තාවන් ප්‍රතික්ෂේප කරති; ඔවුන් අතට ගිය කල අඬති; එහෙයින් පිරිමින් අත ම වැඩෙති. මෑණියන් වහන්සේ කිරි දෙන කල තිරයෙන් පිට සිට තනපුඩුව මැත් කොට කිරි පොවති. බෝධිසත්වයෝ වැඩිවිය පැමිණි පසු කාන්තාවන් නොදක්නාහ. පිය රජු වික්ෂේප ව හිඳිති. රජුගේ උවදෙසින් කාන්තාවක් කුමරුන් කාමයෙහි යෙදවීමට බාර ගනියි. ඒ ස්ත්‍රිය ගී කියා, ගායනා කොට කුමරුගේ සිත ගනී. කුමරු ඇය හා ලෝකාස්වාද රතියෙහි වෙසෙයි. පසු ව කුමරු 'පඤ්චකාම විෂය මා මිසක් අනික් කෙනෙකුන් අනුභව කරන්නේ නම් කුම් දැ'යි කඩුව කොපුවෙන් අයා ගෙන, වීථියට බැස මිනිසුන් පොළු ගසන්ට වන්හ.' පසු ව රජු කුමරු සහ ස්ත්‍රිය නුවරින් නෙරපයි. පසු ව ඔවුහු දෙදෙන හිමාලය ප්‍රදේශයේ පන්සලක් කොට වෙසෙති. අහසින් යා හැකි තවුසෙක් කුමරුන් නැති වෙලාවක ඒ නිවසට එයි. ඒ ස්ත්‍රිය තවුසා සමග ලෝකාස්වාද රතියෙහි යෙදෙයි. ඒ වෙලාවට ම කුමරු ද එයි. බෝධිසත්වයෝ තවුසා මරන්නට ලුහු බඳිති. තවුසා සමුද්‍රය ළඟට ගොස් අහසින් යාමට තැත් කොට මුහුදෙහි වැටෙයි. තවුසාගේ ඍද්ධිය පිරිහුණු බව දැක බෝධිසත්ත්වයෝ කාමයෙහි ආදීනව ගැන තවුසාට දම් දෙසති. තවුසා ධ්‍යාන උපදවා පෙර විසූ දිවයිනට ම යයි. පසු ව බෝධිසත්ත්වයෝ ද ධ්‍යාන උපදවමි යි සිතා, ස්ත්‍රිය ගෙන ගොස්, මඟ සිටවා, 'කැමති තැනකට යව' යි කියා, පිටත් කොට, ධ්‍යාන උපදවා පසු කලෙක මිය පරලොව යති (කුලසූරිය, 2017, පි. 90 - 91).

මේ කතාව මිනිසාගේ කාම ජීවිතය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දෙන්නකි. කාමයෙන් ඉවත් වීමේ ක්‍රම තුනක් දැකිය හැකි ය. එකක් නම් ඒ පිළිබඳ කිසිත් අවබෝධයක් නැති ව ඉවත් වීම යි. අනෙක නම් එහි ආදීනව පිළිබඳ අවබෝධයෙන් ඉවත් වීම යි. අනෙක නම් කාමය කාමය මාර්ගයෙන් ම ඉවත් කිරීම ය. අවබෝධයක් නො ලබා කාමයෙන් ඉවත් වීම ප්‍රායෝගික නැත. ඉඩ ලත් ඕනෑ ම විටෙක ලැබෙන උත්තේජකය අනුව කාමය ඇති විය හැකි ය. එවිට ඇති විය හැකි තත්ත්වය භයානක ය. කාමය කාමයෙන් තෘප්ත කළ නොහැකි ය. එහි නිමාවක් දැකිය නොහැකි ය. හැම විට ම අලුත් දෙයක ඇලෙන මිනිස් සිතට ඒ ඒ අලුත් දේ දෙන්නට යතොත් කිසි දා කාමයෙන් මිදිය නොහැකි ය. ඒ හෙයින් ථේරවාද බුදුදහමේ උගන්වන්නේ කාමය අවබෝධයෙන් ඉවත් කිරීමකි. මෙහි අසනස/ අසනීසාත කුමාරයා කාමය පිළිබඳ අවබෝධයක් නො ලබා ම කාමයෙන් ඉවත් වෙයි. එහෙත් එය ප්‍රායෝගික නොවන්නේ ඔහු හිටිහැටියේ කාමයට ආසක්ත වන නිසා ය.

9 772950 655005

දෙවැන්න අවබෝධයක් නැති ව කාමයෙන් ඈත් වී බොහෝ කලක් සිටි ඔහු එක් විට ම කාමයට ආසක්ත වීමෙන් පසු එහි ම ගිලී යයි. අනවබෝධයෙන් යමක් ප්‍රතික්ෂේප කොට සිට එයට එක වර පිවිසීමෙන් සිදු විය හැකි අහිතකර තත්ත්වය එයින් පෙනේ. උපදින විට ම බ්‍රහ්මචාරී ව්‍රතය සමාදන් වී උපන්නාක් මෙන් සිටි අසනස ස්ත්‍රියගේ කටහඬින් කාමයට ආසක්ත වෙයි. ඔහු ඔහුගේ බ්‍රහ්මචාරිත්වය ද අතහැර දමා කාමයෙහි ගිලෙයි. තවුසා ද ස්ත්‍රියට වසඟ වී, කාමයෙහි ගිලී ධ්‍යානයෙන් ද පිරිහෙයි. මේ සිද්ධි දෙක බුදුහිමියන් දෙසූ ''මහණෙනි, ස්ත්‍රිය රූපය, ස්ත්‍රී ශබ්දය, ස්ත්‍රී ගන්ධය, ස්ත්‍රී රසය, ස්ත්‍රි ස්පර්ශය තරම් පිරිමි සිත ඇද බැඳ ගන්නා එක ද ධර්මයක් මම විශ්වයේ නො දකිමි'' (Anguththaranikaya - PatamaBhago - Ekakanipatha - ChiththaPariyadanaVagga, 1997). යන බුදුවදන සිහිපත් කරවයි.

අසනස/ අසනීසාත කුමාරයා පිළිබඳ කථාවේ අවසානයට කුමාරයා කාමයෙහි ගිලීම සම්බන්ධයෙන් අවබෝධයට පත් වෙයි. ඒ තවුසාගේ ධ්‍යානය පිරිහී මුහුදෙහි වැටීම දැකීමෙනි. වෙනත් ස්ත්‍රීන් සමග ලෝකාස්වාදය කරන පිරිමින් පවා මරනට තරම් ලිංගික ඊර්ෂ්‍යාවෙන් පෙළුණු අසනස කාමය පිළිබඳ ඒ අවබෝධයෙන් පසු ව තම ස්ත්‍රිය සමග සංවාසයෙහි යෙදුණු තවුසා පවා නො මරා අත් හරියි; එමෙන් ම ස්ත්‍රිය ද නො මරා අත් හරියි. අවබෝධයෙන් කාමය ප්‍රතික්ෂේප කිරීමෙන් පසු අසනස ධ්‍යාන ද ලබා ගනියි. කතාව ශාන්තභාවයෙන් අවසන් කිරීම එතෙක් මෙතෙක් කල් අශාන්ත ජීවිතයක් ගෙවුයේ නම් ඒ මේ ජීවිතය ශාන්තභාවයෙන් නිමා කිරීමට මඟ පෙන්වයි.

සද්ධර්මරත්නාවලියේ කුණ්ඩලකේශී කථාව හැඟීම්වලට වහල් වී තීරණ ගැනීමත්, තර්ක බුද්ධියෙන් යුතු ව තීරණ ගැනීමත් විවරණය කෙරෙන කථාවකි. ඒ කථාව සැකෙවින් මෙසේ ය. කුණ්ඩලකේශි සිටු කුලයක සොළොස් වියැති දියණියකි. දෙමවුපියෝ ඇය ශ්‍රී යහන් ගබඩාවෙක ලා රකිති. එකලට රාජපුරුෂයෝ සොරකු අල්ලා මරන්ට ගෙන යති. සිටුදියණිය හොරා කෙරෙහි බැඳෙයි. ඇය බතුත් නොකා යහනට වී සිට ජීවිතය අත්හරින බව කියා අවසානයේ සොරා ලබා ගනියි. ඇය සොරාගේ සිත් ගන්නට සියලු ආවතේව කරයි. සොරා ඒ ජීවිතයට ප්‍රිය නැත. ඔහු එයින් ගැල වී යන්නට සිතයි. ඔහු උපායෙන් කුණ්ඩලකේශි සොරුන් හෙළන පව්වට ගෙන ගොස් මරන්ට තැත් කරයි. කුණ්ඩලකේශි ද සොරාගේ සිත ගන්නට අවැසි නිසා ඔහුගේ උපායට හසු වේ. සොර පව්වේ දී සොරා තම අරමුණ කුණ්ඩලකේශිට කියයි. කුණ්ඩලකේශි එහි දී ද සොරාට අවනත වී ජීවත් වන්නට උත්සාහ කොට සොරා ඇය මරන්ට ම සිතා ගත් හෙයින් උපායෙන් සොරා මරා දිවි ගලවා ගනියි. පසු ව ඇය නිවසට නො ගොස්, රන් අබරණ ද සඟවා, පරිබ්‍රාජිකාවන් වෙත ගොස්, පරිබ්‍රාජිකාවක වී, වාද උගෙන, වාද කරමින් ගොස්, අවසානයේ සැරියුත් හිමියන් සමග වාදයට ගොස්, පැරදී, බුදුසසුනේ පැවිදි වී රහත් වෙයි (ඤාණවිමල හිමි, 2017, පි. 594 - 600).

මේ කතාවේ එන ආකාරයට කුණ්ඩලකේශි සොළොස් වියේ දී පිරිමින්ගේ ඇසුරෙන් සහ යෙහෙළින්ගේ ඇසුරෙන් වෙන් ව හුදෙකලා ව වස්වා ඇත. දරුවන් රැකීමේ හොඳ ම ක්‍රමය නම් වරදට යා හැකි සියල්ලෙන් ඔවුන් ඈත් කොට තැබීම බව දෙමවුපියෝ සිතති. එහෙත් මෙය අසාර්ථක ක්‍රමයක් වන්නේ කුණ්ඩලකේශි සොරකු දැක, ජීවිතය පරදු කොට ඔහු ලබා ගැනීමෙනි. එහෙයින් මෙය අවබෝධය ලබා නො දී, හිර කොට තැබීමේ නිසරුකම පසක් කරවන්නකි. පිරිමින්ගෙන් ඈත්

9 772950 655005

කොට තැබීම වෙනුවට පිරිමින් ගැනත් සමාජය ගැනත් අවබෝධය ලබා දුන්නේ නම් කුණ්ඩලකේශී සොරකු ඉල්ලා අරගල නොකිරීමට තිබිණි. සැඟවීම, ඉවත් කොට තැබීම සැම දා කළ නොහැකි ය. එහෙයින් වඩා වැදගත් වන්නේ අවබෝධය ලබා දීම ය.

හැඟීමට වහල් වන විට තර්කය යටපත් වීම මේ කතාවේ දක්නට ලැබේ. කුණ්ඩලකේශී සොරා ඉල්ලීමේ දී කිසි ඇඳුනුම්කමක් නැති හොරකු හා ගෙවන විවාහ ජීවිතය ගැන කිසිත් තර්ක බුද්ධියෙන් නො සිතයි. ඇය ආදරය සහ රැකබලා ගැනීම ද වටහා ගෙන සිටියේ දෙමවුපියන්ගෙන් තමාට ලැබුණු ආදරය සහ රැකබලා ගැනීම ඇසුරෙනි. ඇය තමා ලත් ජීවිතය සැලකිලි සම්මාන තම සැමියාට ද එලෙස ම දෙයි. එහෙත් පිරිමීහු සුරතලුන් සේ ජීවත් වීමට නොකැමැත්තෝ ය. කා බී ඇවිද නිදහස විඳි අයකු හිර කොට තබා ගැනීමට නොහැකි බව පෙනෙයි. සොරා ඇය මරන්නට ගෙන යාමේ දී තනි ව යාමටත් ආභරණ සියල්ල පැලඳ යාමටත් කරන යෝජනා පිළිබඳ ඇය කිසිත් තර්ක බුද්ධියෙන් නො සිතයි. හැඟීම්වලට වහල් වූ පසු අවශ්‍යා වන්නේ හැඟීම ජය ගැනීම පමණි. ඇය සොර පව්වේ දී හෝ තර්ක බුද්ධියෙන් නොසිතුවේ නම් මේ හැඟීම්වලට වහල් වීම මරණයෙන් කෙළවර වන්නට තිබිණි.

සොරපව්වේ සිට ඇය දිගට ම තර්ක බුද්ධියෙන් කටයුතු කරයි. නිවසට නැවත නො යාම, ආභරණ සැඟවීම, පරිබ්‍රාජිකාවන් වෙත යාම, වාද දහස ඉගෙනීම වැනි කරුණුවලින් පෙනෙන්නේ තර්ක බුද්ධියෙන් කරන දෙය ඇයට ජය ගෙනා බව යි. එහෙයින් මේ කථාව ජීවිතයට යථාවබෝධයේ වැදගත්කමත්, හැඟීම්වලට වහල් වීමේ අනර්ථකාරීභාවයත්, තර්ක බුද්ධියේ අර්ථකාරීභාවයත් ඉස්මතු කරන කථාවකි. ඒ  පිළිබඳ ජීවිත පරිඥානයක් ශ්‍රාවකයාට ලැබේ.

අමාවතුරේ දිට්ඨමංගලිකා කථාව උපහාස රසැති කථාවක් වශයෙන් වියතුන් අතර ප්‍රචලිත ය. සැකෙවින් ඒ කථාව මෙසේ ය. දිට්ඨමංගලිකා නම් රූමත් ධනවත් කුලවත් සිටුදියණියක් වෙයි. ඇය තමා පතා එන පිරිමින්ගේ දොස් කියා ඔවුන්ට නින්දා කරයි. 'මෙසේ වූවක්හු දිටිමි' යි ඇස් සෝදයි. ඇය දිනක පිරිවර සහිත ව ආහාරපාන ද ගෙන දිය නෑමට යයි. එකල්හි සැඩොල් කුලයෙහි උපන් මාතංග නම් බෝධිසත්වයෝ කිසි කාර්යයකට නුවරට පිවිසෙති. දිට්ඨමංගලිකා මාතංගයන් දැක, පිළිකුල් කොට, මුව දොවා ආපසු නිවසට යයි. පිරිවරජනයෝ මාතංගයන්ට පහර දී, මැරුණේ යයි සිතා කසළ ගොඩට දමති. බෝධිසත්වයෝ සිහි ලබා, මේ විපත් දිට්ඨමංගලිකා නිසා වූ බව සලකා 'දිට්ඨමංගලිකා ලදොත් නැගිටිමි නො ලදොත් මියෙමි' යි දිට්ඨමංගලිකාවගේ ගෙහි මිදුලෙහි වැතිරෙති. සැඩලෙකු ගේ මිදුලෙහි මළොත් දෙපසින් පවුල් දාහතරක් සැඩොල් වන බවට සම්මතයක් එකල විය. එහෙයින් සියල්ලෝ නොයෙක් දැ දී ඔහු පිටත් කරවන්නට නොයෙක් උත්සාහ කරති. ඔහු දිට්ඨමංගලිකා ම ඉල්ලයි. අවසානයේ පිරිස එක් ව දිට්ඨමංගලිකා මාතංගයන්ට දෙයි. ඔහු ඇයගේ කර මතින් ම නුවර හැම වාසල කෙරේ ම ඇවිද, ඇගේ මානය බිඳ සිය නිවසට යයි. බෝසත් මාතංග ඇයගේ ජන්ම භේද නො කොට, දවස් යවා, 'මැය ශ්‍රේෂ්ඨ කාන්තාවක කරමි' යි සිතා, පැවිදි ව කසිණ වඩා, අෂ්ටසමාපත්ති ලබා, අහසින් පැමිණ, බැස, සිහමින් ගොස් දිට්ඨමංගලිකා වෙසෙන නිවසට යයි. දිට්ඨමංගලිකා 'ඔබට මෙවන් සිතක් වී නම් මා මහත් යසසින් පිරිහෙළා අනාථ කළේ කුමකට දැ' යි හඬා වැලප, වඩා හිඳවා දන් දෙයි. මාතංග තමාට ඇය ශ්‍රේෂ්ඨ ම කාන්තාවක කළ හැකි බව කියා, සනසා, නගරයට ගොස් තමාගේ හිමියා සැඩොලෙක් නොවන බවත් මහාබ්‍රහ්මයා බවත් තම මහාබ්‍රහ්ම

9 772950 655005

සැමියා පුන්පොහෝ දින සඳමඬල බිඳ තමා වෙත එන බවත් හඬගා කියන ලෙස කියයි. බෝසත්හු මිනිසුන්ට පෙනෙන සේ සඳමඬල බිඳ අවුත් ඇය ගැබ්ගන්වා යති. එතැන් පටන් ඇය පා සේදූ දිය දඹදිව රජකුමරුවන්ට රාජාභිෂේක උදක වෙයි (ඤාණාලෝක හිමි, 2017, පි. 70 - 84).

මානයෙන් උදම් ව මිනිසුන් තළා පෙළීම් මිනිසුන්ට බලවත් චිත්ත පීඩා ගෙන දෙන බවත් ඒ නිසා ම මානයෙන් උදම් අයට වන සමාජ පීඩනයත් සමාජ සම්මතයන්ට අධිකාරි බලයක් ලැබෙන බවත් පුරුෂභාවය යනු කාන්තාව තළා පෙළීම නොවන බවත් අපූරුවට විවරණය කෙරෙන කථාවකි, මෙය. තමාට වූ ගැහැට නිසා මාතංග දිට්ඨමංගලිකාගේ මානය බිඳීමට ඇය පීඩාවට පත් කළ ද අවසානයේ ඔහු තම බිරිඳ ශ්‍රේෂ්ඨත්වයට පත් කරයි. තමාගේ සහායට සිටින කෙනාගේ ජීවන සෞභාග්‍යය ඇති කිරීම පිළිබඳ උත්තේජනයක් සපයන මේ කතාව මානයත්, පුරුෂභාවයත් පිළිබඳ ජීවිත පරිඥානයක් ලබා දෙන්නකි.

## 1.3 සමාලෝචනය

සාහිත්‍යය යනු භාෂාව මාර්ගයෙන් නිර්මාණාත්මකභාවය සහ චමත්කාරය ඇති කෙරෙන කලාව යි. එහි ආකෘතික ස්වරූපය සහ අන්තර්ගතය සලකා විවිධ ප්‍රභේද දැකිය හැකි ය. ගද්‍යය යනුවෙන් හැඳින්වෙන්නේ විරිතකට අනුව නොබැඳුණු, පාද වශයෙන් වෙන් නොකෙරුණු සාහිත්‍යාංගය යි. සිංහල ගද්‍ය කාව්‍යවල ද විවිධ ප්‍රභේද ඇත. බුදුදහම අන්තර්ගත වන හෝ බුදුදහම හා සම්බන්ධ වුණු කතා අන්තර්ගත වන ගද්‍ය සාහිත්‍යය, බණකතා සාහිත්‍යය යනුවෙන් හැඳින්වේ. සිංහල සාහිත්‍යයේ ආරම්භක අවධියේ සිට දැකිය හැකි මේ සාහිත්‍යාංගය මුල් කාලයේ පරිවර්තන ස්වරූපයෙන් පැවැති අතර පසු ව බණ කීමේ අරමුණ අනුව ව්‍යාකරණයට මූලිකත්වය නො දී ලෙව්ලැකියට සමීප වෙමින් හැඩ ගැසී ඇති බව පෙනේ. ඇතැම් බණකතා කෘතියක් කිසියම් එක් කරුණක් ඉස්මතු කරමින් සංග්‍රහ කර ඇති අතර ඇතැම් බණකතා කෘතියක් බණකීම ම අරමුණු කර ගත් කතා සංග්‍රහ කරමින් සම්පාදනය කර ඇති බව පෙනේ. මේවායෙහි පොදු අරමුණ වන්නේ බුදුදහමට අනුව ජීවත් වීමේ විපාක සහ එසේ ජීවත් නොවීමේ දුර්විපාක හඳුන්වා දීමත් ත්‍රිවිධ රත්නය පිළිබඳ සහ ත්‍රිවිධ චෛත්‍යය පිළිබඳ අවබෝධය ලබා දීමත් ය.

බණකතා සාහිත්‍යයේ අන්තර්ගතය බුදුදහම ඉගැන්වීම් නිසා ම එහි ජීවිතය සහ සංසාරය පිළිබඳ අවබෝධය ලබා දීම දැකිය හැකි ය. මේ බණකතා බෞද්ධ භික්ෂූන් වහන්සේගේත් ගිහියන්ගෙත් පාරම්පරික අද්දැකීමත්, සාමූහික වෘද්ධ ඥානයත්, භාවනාවත්, සමාධියත් පිළිබිඹු කරන කතා නිසා ඒවායෙහි අපූර්ව ජීවිත පරිඥානයක් සහ මානවවාදයක් අන්තර්ගත වන අතර ඇතැම් කතාවක එන ජීවිත පරිඥානය නූතන විශිෂ්ට නවකතාවක ජීවිත පරිඥානයට සමාන ය යන මාර්ටින් වික්‍රමසිංහගේ අදහස සාධාරණ බව පෙනේ. මේ අනුව ‘සිංහල බණකතා සාහිත්‍යය යනු ශ්‍රාවකයාට/පාඨකයාට ජීවිත පරිඥානය ලබා දෙන කතා විශේෂයක් ලෙස හැඳින්විය හැකි ය’ යන ප්‍රකාශය සාධාරණ සත්‍ය ප්‍රකාශයක් ලෙස නිගමනය කළ හැකි ය.

9 772950 655005

## 1.4 මූලාශ්‍රය නාමාවලිය

කුලසූරිය, ආනන්ද. (2017). පුංචි බණ්ඩා මීගස්කුඹුර, උදය ප්‍රශාන්ත මැද්දේගම, වරකාවේ ධම්මාලෝක හිමි, පොල්ලමුරේ සෝරත හිමි (සංස්.). **පන්සිය පනස් ජාතක පොත දෙවන කාණ්ඩය**. කොළඹ: ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

ගම්ලත්, සුචරිත. (2009). **අ.පො.ස. (උසස් පෙළ) විභාගයට නියමිත ජාතක පොත**. නුගේගොඩ: සංහිඳ ප්‍රකාශකයෝ.

ඥාණවිමල හිමි, කිරිඇල්ලේ. (සංස්.). (2017). **සද්ධර්මරත්නාවලිය**. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සමාගම.

ඥාණසීහ ස්ථවිර, හේන්පිටගෙදර. (1964). **සාහිත්‍යය**. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සමාගම.

ඥාණාලෝක හිමි, කෝදාගොඩ. (සංස්.). (2004). **අමාවතුර**. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

පඤ්ඤාකිත්ති හිමි, කොටහේනේ. (2000). **සාහිත්‍යය හා සමාජය**. කැලණිය: වැලම්ටියාවේ කුසලධම්ම නායක ස්ථවිර.

**පුරාතන ගද්‍ය සංග්‍රහය** (2017 වර්ෂයේ සිට උසස් පෙළට නියමිත). (2017). ගම්පොළ: සිත්මිණි ජාත්‍යන්තර ප්‍රකාශකයෝ සහ බෙදාහරින්නෝ.

ප්‍රාචීන භාෂෝපකාර සමාගම. (2000). **සද්ධර්මාලංකාරය**. කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

වික්‍රමසිංහ, මාර්ටින්. (2008). **බණ කථා සාහිත්‍යය**. රාජගිරිය: සී. ස. සරස (පුද්ගලික) සමාගම.

විපුල හිමි, ගිනිකටුවැවේ. (2013). කාව්‍ය නමැති සාහිත්‍යාංගය හා එහි සමාජීය අවශ්‍යතාව. දඹුල්ලේ සුදේව හිමි, වලල සීවලී හිමි, උලුක්කුලමේ ඥාණරතන හිමි, හිඟුරුකඩුවේ ආනන්ද හිමි (සංස්.), **විදුසරණි ශාස්ත්‍රීය සංග්‍රහය තෙවන කලාපය 2012**. පේරාදෙණිය: සාමූහික භික්ෂු සංගමය.

**සම්භාව්‍ය සිංහල කාව්‍යයේ විකාසනය**. (2004). නුගේගොඩ: සීමාසහිත සරසවි ප්‍රකාශකයෝ.

සුරවීර, ඒ. වී. (2014). **සිංහල සාහිත්‍ය සම්ප්‍රදාය**. කොළඹ: ෆාස්ට් පබ්ලිෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්.

**ශබ්දකෝෂ**

සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර ඇතුළු පිරිස. (1992). **සිංහල ශබ්ද කෝෂය - 18, 25_කාණ්ඩ**. කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

සෝරත හිමි, වැලිවිටියේ. (1999) **ශ්‍රී සුමංගල ශබ්දකෝෂය - ද්විතීය භාගය**. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Anguththaranikaya - PatamaBhago - Ekakanipatha - ChiththaPariyadanaVagga, *ChattaSangayana CD Rom* (Dhammagiri Vipassana Research Institute, 1997).

Pound, Ezra. (1934). ABC *of Reading*. New York: New Direction Publishing Coparation.

Warren, A. and R. Wellak. (1961). *Theory of literature*. London: Jonathan Cape.

වී. පියුමි දිනුෂිකා විද්‍යාරත්න
පළමු වසර
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
vidyarathnapiyumi@gmail.com

9 772950 655005